
# රොබෝගේ ඇබැද්දිය



ආර්.එම්. මෙතුනි සයාරා රත්නායක

# රොබෝගේ ඇබැද්දිය

ආර්.එම්. මෙතුනි සයාරා රත්නායක

කතෘ

කතෘගේ වෙනත් කෘති : තුන්ඉරි අප්පු

මහාමායා බාලිකා විදුහල,මහනුවර

6 E

2025.02.08

ISBN : 978-624-208-186-1

# පිදුම

කුඩා කල සිට

මා හට අකුරු කියාදුන්

මාගේ ආදරණීය

ගුරු මෑණිවරුන්ට හා ගුරු පියවරුන්ටත්

මාගේ ආදරණීය දෙමාපියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථරකණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්දස්සීමාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන " හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකෝමත් එක රටක ඒන්ජලා කියලා ලස්සන කුමාරිකාවක් ජීවත් වුණා. මේ කුමරිය මුළු දවසම තම කාමරයට වී කාලය ගත කළා. නමුත් මේකට රජුටත් රැජිනටත් දුක සිතුණා. කුමරියගේ සියලු කටයුතු හා ඇයගේ වගකීම් රජුටත් රැජිනියටත් කිරීමට සිදු වුණා. ඒන්ජලා කුමරිය තම කාමරයට වී මුළු දවසම ගත කළේ රොබෝලා සෑදීමටය. කුමරියට මේ අදහස පහල වුණේ එක් දිනයක කුමරිය දුටු සිහිනයක් නිසයි. ඒ තමන් විසින් රොබෝලා සාදා ඔවුන්ගේ සහයෙන් තම රට දියුණු රටක් බවට පත්වනු දැකීමයි. එම සිහිනය දැකීමෙන් පසු රොබෝවරු සෑදිම ගැන තොරතුරු රැස් කිරීමට කුමරිය උනන්දු වුණා. ඒ නිසා කුමරියගේ කාමරය ඒ පිළිබඳ පොත් වලින් ගොඩ ගැසුණා. ඒ නිසා කුමරියගේ කාමරය එකම අවුල් ජාලාවක් ව තිබුණා. එක් දිනක් මේ ඒන්ජලා කුමරිය අපූරු ප්‍රයෝජනවත් සොයා ගැනීමක් කළා. ඒ අවුල්ව තිබෙන සෑම දෙයක්ම පිළිවෙළකට සකස් කරන රොබෝ කෙනෙක් සෑදීමය. මේ අත්හදා බැලීමෙන් පසු කුමරියගේ අවුල්ව තිබූ කාමරය අලංකාර කාමරයක් බවට පත්වුණා. මේ රොබෝට ''ක්ලීන් අප් එව්රිතින්'' යන රහස් වචනය පැවසූ විට පමණක් කසළ සියල්ල කා දමයි. නමුත් වෙනත් වචනයක් පැවසුවහොත් මේ රොබෝ කා දැමූ කසළ සියල්ලම නැවත මුහුණට විසිකරයි. ඉතින් කුමරිය මේ රොබෝව ''කිකි'' යන නමින් අමතන්න පුරුදුව සිටියා.



දිනක් රජතුමා කුමාරිකාවගේ කුටියට පැමිණෙන විට කිකී කුමරියගේ කාමරය පිරිසිදු කරමින් සිටින අයුරු දුටුවා.

ඒ දැක රජතුමා තම දියණිය ගැන පුදුමයට පත් වුණා පමණක් නෙවෙයි රජුගේ කාමර පිරිසිදු කර ගැනීමට කිකීව කාමරයට ගෙන ගියා.රහස් වචනය පවසා තම කුටිය පිරිසිදු කරගත් රජු මේ අත්දැකිම තම බිරිඳට ලබාදීමට සිතා කිකීව බිසවගේ කාමරයට ද ගෙන ගියා. ඉතින් කුමාරිකාව හදපු මේ රොබෝ රැජිනගේ කාමරයත් පිරිසිදු කළා.



ඉන් පස්සේ කිකීව රාජ්‍ය පුරාම ගෙන ගියා. ඒ සඳහා වෙනම සේවකයෙක්ද පත් කළා. මෙය දැනගත් නපුරු මන්තරකාරියක් කිකීව සොරකම් කර රහස් වචනය පවසා සිටියා. නමුත් ඇයට එම අපහසු වචනය නිවැරදිව කියන්න බැරි වුණා. රහස් වචනය කියද්දි ගොත ගැසුණා. එම නිසා කිකී කෑ දැමූ කසළ සියල්ල නැවත නපුරු මන්තරකාරිගේ මුහුණට විසිකළා. මෙයින් මන්තරකාරිය දැඩි කෝපයට පත් වුණා. මන්තරකාරියට කුමාරිය සමඟ දැඩි තරහක් ඇතිවුණා. ඉතා බලගතු මන්තරයක් කර මේ කුමරිය මරා දැමීමට සිතා ගත්තා. තම පරීක්ෂණ කාමරයට ගිය මන්තරකාරිය විවිධ වූ දියර වර්ග භාවිත කර එක් දියරයක් සාදා ගත්තා. නමුත් මේ දියරය සාදා ගන්නා අවස්ථාවේ මන්තරකාරිය අතින් එක් දියරයක් වැඩිපුර වැටුණා. ඒ පිළිබඳ කිසිම තැකීමක් නොකළ මන්තරකාරිය එම දියරය කුමරියගේ ඇඟට හැලීමට සිතා මාලිගයේ කිසිම කෙනෙකුට නොපෙනී අදෘශ්‍යමානව මාලිගයට ඇතුළු වුණා. නිදි යහනේ සිටිනා කුමරියගේ ඇඟට දියර වත්කළා. පසුදින උදාවන විට කුමරියගේ ගතට අමුත්තක් දැණුනා. නමුත් ඒ ගැන තැකීමක් නොකළ කුමරිය තමන් විසින් නිර්මාණය කරමින් සිටින නව රොබෝ ගැන සිතමින් යහනෙන් බිමට බැස්සා.

ඒ සමඟම කුමරියට ක්ලාන්ත  ගතියක් දැණුනා. තම සේවිකාවට කෑගැසූ කුමරිය එතැනම ඇද වැටුණා. සේවිකාවගේ විලාපය ඇසුණු සේවකයෝ එහි පැමිණ සිදුවී ඇති දෙය රජුට සැල කළා.



එතැනට පැමිණි රජු හා දේවිය හඬා වැලපෙන්නට වුණා. ඉන් පසු යහන අසළට ගිය රජුට යහනේ කොළ පැහැති දියරයක් වැටී ඇති අයුරු දක්නට ලැබුණා. සිදුවී ඇති දේ සොයා බැලූ රජු නපුරු මන්තරකාරිය එලවා දැමුවා. ඉන් සති කිහිපයකට පසුව සම්පූර්ණ සුවය ලද කුමරිය  තම අත්හදා බැලීම් දිගටම කර ගෙන ගියා.

කුමරිය විසින් රාජ්‍යයේ වැඩ පහසු කර ගැනීම සඳහා නොයෙක් වර්ගයේ රොබෝවරු නිපදවූවා. ඒවා තම රාජ්‍යයේ කටයුතු සඳහා යොදාගත් රජු රට වැසියන්ගේ හා රාජ්‍යයේ දියුණුව උදෙසා යොදා ගත්තා.

ඉතින් ඔහොම ටික කාලයක් අත්හදා බැලිම් ගොඩක් කර කර ඉන්න අතර හදිසියේම රජතුමා මියගියා. ඉන්පසු කුමරියට රාජ්‍ය පාලනය කරන්න සිදුවුණා. ටික කාලයක් යනකොට කුමරියට රාජය පාලනය සමඟ රොබෝවරු සෑදීමත් කරගෙන යාමට අපහසු වුණා. එක් දවසක් රහස් සාකච්ඡාවක් අවසන්වී කුමරිය තම කාමරයට පියමැන්නේ තමන් අත්හදා බලමින් සිටි රොබෝගේ වැඩ අවසන් කිරීමේ අරමුණෙන්. එහි වූ ප්‍රශ්නයක්ද කල්පනා කරමින් රොබෝ පරීක්ෂා කිරීමට දුරස්ථ පාලකය අතට ගත් කුමරිය එහි  ඇති කොළ පැහැති බොත්තම එබුවා. නමුත් එයින් වූයේ බලාපොරොත්තු නොවූ දෙයක්. ඒ වෙනත් වැරදුණු රොබෝ කෙනෙක් ක්‍රියාත්මක වීමයි. ඉන්පසු එම රෙබෝව පාලනය කිරීමට කුමරිය නොහැකි වුණා. ඉතින් මේ රොබෝ සියළුම දේ විනාශ කරමින් ඉදිරියට ගමන් කළා. රජමාලිගාවම අවුල් කර නගරයට ගිය රෙබෝ පසුපස කුමරිය ද ගමන් කළේ විදුලි වේගයෙනි.

නමුත් කුමරියට රොබෝව නවතා ගැනීමට නොහැකි වුණා.තවදුරටත් නගරය පුරා යන රොබෝ නගරයේ  ගොඩනැගිලි විනාශ කළා. ඒක දැක්ක මිනිස්සු හොඳටම බය වෙලා ඒ මේ අත දුවන්න ගත්තා.

ඉතින් කුමරියටත් බැණ බැණ බයෙන් හැංගෙන මිනිස්සු දැකලා කුමරියටත්

කළකිරුණා. ඉතින් ඊට පස්සේ දුක හිතුණු කුමරිය සිතුවේ තමන් අතින් මේ පොහොසත් නගරයම විනාශ වුණා කියලා. එයින් තරහා ගිය කුමරිය  ආපසු සුන්බුන් වි ගිය රජමාලිගය තුළ තමන්ගේ කාමරය සොයා ගත්තා. තම හිත තුළ තිබෙන ආවේගය සමගම තම කාමරයේ විසිරී තිබෙන සෑම දුරස්ථ පාලකයකම කොළ පැහැති බොත්තම ඔබා සෑම රොබෝ කෙනෙක් ම ක්‍රියාත්මක කළා. එයින් සිදුවුණේ තවත් නගරය කලබල විමයි.ඉතින් ඊට පස්සේ කුමරියම සෑදූ දියරයක් කුමරිය පානය කළා. එයින් සිදුවුණේ කුමරියත් රොබෝ කෙනෙකු වීමය. ඊට පස්සේ කුමරියත් රොබෝ කෙනෙක් වගේ කතා කළා. රොබෝ කෙනෙක් වගේ ඇවිද්දා. අනෙක් රොබෝවරු පසුපස යමින් නගරයේ වීදී දිගේ ඇවිද ගියා.කුමරිය ගැන දැන ගන්න ලැබුණු වැසියන් කලබලයට පත්වුණා වගේම දුක් වුණා. රොබෝලා හදලා නගරය දියුණු කරපු කුමරියට දැන් වෙලා තියෙන දේ දැකලා ඔවුන් දුක් වුණා. මේ ගැන රජමාළිගාවට ගොස් රැජිනත් එක්ක කතා කරන්න සිතා ගත් වැසියන් එක්රැස් වී මාලිගයට ගියා.

කුමරිය බේරාගන්න ඕනෑම දෙයක් කරන්න වැසියන් ඉදිරිපත් වුණා. කුමරියට නපුරු මන්තරකාරියගේ සාපයක් වැදී ඇති බවත් මන්තරකාරිය සොයා ගොස් එම සාපය ඉවත් කර ගත යුතු බවත් පුරෝහිත බමුණන් රැජිනට සැල කර සිටියා.

ඉන්පසු රාජපුරුෂයන් සමඟ රැජින මන්තරකාරිය හමුවෙන්න යන්න තිරණය කළා. මන්තරකාරියගේ  ගෙදරට ළඟාවුණු රැජින මන්තරකාරියට කතා කළා. නපුරු ලෙස සිනාවක් පාමින් මන්තරකාරිය රැජින ඉදිරියට පැමිණියා.

තම දියණියගේ තත්ත්වය මන්තරකාරියට පැවසූ රැජින කුමරියට කරන ලද සාපය ඉවත් කර දෙන ලෙස මන්තරකාරියගෙන් ඉල්ලා සිටියා.

කුමරියට කරන ලද සාපය ඉවත් කිරීමට නම් තමන්ගේ කොන්දේසි කිහිපයකට එකඟ විමට සිදුවන බව මන්තරකාරිය පවසා සිටියා.

රාජ්‍යයෙන් කොටසක් තමන්ටත් අවශ්‍ය බවත් මින් ඉදිරියට රොබෝවරු සෑදීම කුමරියට තහනම් බවත් මන්තරකාරිය කීවා. එම කොන්දේසි වලට එකඟ වන්නේ නම් තමන් කුමරියට කරන ලද සාපය ඉවත් කිරීමට කැමැති බව මන්තරකාරිය රැජිනට කියා සිටියා.

තවද,  කිසිම වැසියෙක්ට රටින් පිටව යාමට හෝ පලා යෑම තහනම් බවත් එසේම රාජපුරුෂයන්ගෙන් හතරෙන් එකක් මන්තර ඉගෙන ගත යුතු බවත් එයින්  තෝරා ගන්නා රාජපුරුෂයෙන් 100 දෙනෙක් තමාගේ සේවකයන් විය යුතු බවත් තමාට මන්තර කාමරයක් අවශ්‍ය බවත් මන්තරකාරිය රැජිනට පැවසුවා.

මේ පිළිබඳ සිතා කැමති තීරණයක් ගැනීමට දිනක කාලයක් ලබාදෙන බව පැවසූ මන්තරකාරිය නොපෙනී ගියා.

මන්තරකාරියගෙන් සමුගෙන රජින නැවත මාලිගයට පැමිණියේ තමා කුමක් කරන්නේ දැයි සිතමින්ය. ඒ එන අතරමඟ දී රාජපුරුෂයන් රජිනට සැලකර සිටියේ යාබද ගම්මානයේ තවත් මන්තරකාරියක් සිටින බවත් ඇය මුණගැසී යම් පිළියමක් ලබාගත හැකිදැයි විමසා බැලීම සුදුසු බවත්ය.

ඉන්පසු රජින එම මන්තරකාරිය මුණගැසීමට ගියා. මේ මන්තරකාරිය නපුරු මන්තරකාරියගේ නැඟණිය බව සැලවුණා. රජින මේ මන්තරකාරියට සියලුම තොරතුරු නොවලහා පැවසුවා. කුමරිය ගැන දුක හිතුණු මේ මන්තරකාරිය තම සහෝදරිය විසින් සිදුකර ඇති ශාපය ඉවත් කිරීමට එකඟ වුණා.හෙට දින හිරු නැගෙන්නට පෙර කුමරිය රැගෙන එන ලෙස රජිනට දන්වා සිටියා. කුමරිය රැගෙන එන බව දන්වමින් රජින මන්තරකාරියගේ නිවසින් පිටත් වුණේ ඉතා සතුටින්.

නපුරු ලෙස සිනාවුණු මන්තරකාරිය තම මන්තර කාමරය දෙසට ගියේ හෙට දිනයට වුවමනා දෑ සූදානම් කර ගැනීමටයි. තම මන්තර කාරමයේ නපුරු මන්තරකාරිය ඉන්නා බව  මේ මන්තරකාරිය දැක්කා. “නුඹ මට රාජ්‍යයෙන් කොටසක් හිමි වීමට තිබූ අවස්ථාව නැතිකර දැම්මා” යි කියා තම නැඟණියට දොස් පැවරුවා. රාජ්‍ය හිමි කර ගැනීමේ ආශාවෙන් පෙළුණු නපුරු මන්තරකාරිය තම නැඟණිය මරා දැම්මා.

ඉන්පසු තම නැඟනියගේ වෙස්ගත් නපුරු මන්තරකාරිය කුමරිය සහ රජ බිසව පැමිණෙන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියා. මේ කිසිවක් නොදත් රජ බිසව හා කුමරිය පසු දින හිරු නැගෙන්නට මත්තෙන් මන්තරකාරියගේ නිවසට පැමිණියා. නමුත් කිසිවකුත් නොසිතූ අයුරින් නපුරු මන්තරකාරිය කුමාරියගෙන් පළිගැනීමේ චේතනාවෙන් යළිත් වතාවක්  බලගතු මන්තරයක් කරවා කුමරිය සදහටම නිදි කරවා රජ බිසව මරා දැමුවා. නපුරු ලෙස සිනාසුණු මන්තරකාරිය රාජ්‍ය තමන් යටතට ගන්නා අයුරු කල්පනා කළා. රටේ සියලුම වැසියන් තමන්ට නතු කරගැනීමේ අපේක්ෂාවෙන් තමන්ගේ වසඟයට  ගතහැකි වායුවක් සාදා එය රාජ්‍ය පුරා මුදා හැරියා.ටිකෙන් ටික රට වැසියන් මේ මන්තරකාරියගේ කීමට නතු වුණා. ඉන්පසු මේ කපටි මන්තරකාරිය ඡන්දයක් තිබ්බා. ඉතින් මේ මන්තරකාරියට වශී වෙලා හිටිය  ඔක්කොම මිනිස්සු මන්තරකාරියට ඡන්දය දුන්නා. මන්තරකාරිය අන්තිමේදී රටේ පාලකයා වුණා.

නිමි.



# පසුවදන

රටේ අනාගතය සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකිවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්,ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්